# RPL

## අයදුම්පත් ඉදිරිපත්කිරීමේ මාර්ගෝපදේශය

ඇගයීම් තත්ත්ව ආරක්ෂණ අංශය
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

# 1.0 හැඳින්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) රටේ කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET) අංශය සඳහා නියාමන ආයතනය ලෙස ස්ථාපිත කර ඇත. ලියාපදිංචි පුහුණු ආයතන විසින් ලබාදෙන NVQ සහතිකවල තත්ත්ව ආරක්ෂණය මෙම ආයතනය මඟින් සිදුකරයි.

2005 වර්ෂයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව හඳුන්වාදීමත් සමඟ, TVEC විසින් පහත ක්‍රම මගින් NVQ සහතික ප්‍රදානය කරයි.

- නිපුණතා පාදක පුහුණුව (CBT)
- පෙර දැනුම මත පදනම් වූ පිළිගැනීම (RPL).
- කර්මන්ක මත පදනම් වූ පුහුණුව (EBT)

මීට අමතරව, TVEC විසින් නම්‍යශීලී ඉගෙනුම් මාදිලිය (FLM) පුහුණුවීම්වල සාර්ථක අපේක්ෂකයින් සඳහා RoA ජාතික සහතික නිකුත් කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම කර්මාන්තයේ නියුතු අයට ශිල්පීය මොඩියුලර් පදනම් කරගත් කෙටි කාලීන පාඨමාලා හැදෑරීමට සහ මෙම ඉගෙනුම් ක්‍රමය හරහා "Nano Qualifications" ලබා ගත හැකිය.

පෙර දැනුම (RPL) මඟින් වෘත්තීය නිපුණත්වය ලබා ගැනීම යනු විධිමත් හෝ අවිධිමත් පුහුණුවක් වෘත්තීය අධ්‍යාපනයේ ලබා ඇති සේවා පළපුරුද්දක් හෝ සාමාන්‍ය ජීවන අත්දැකීමක් ඇතුළත් වන ක්‍රම මඟින් ඔවුන්ට පවතින නිපුණතාවය මත වෘත්තීය සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාවලියයි.

විදේශගත රැකියා මඟින් පැමිණෙන සංක්‍රමණික සේවකයන් සහ විදේශ රටවලට සංක්‍රමණය වීමට අදහස් කරන කෙටි කාලයක් තුළ NVQ සුදුසුකම් ලබා දීමේ අරමුණින්, අයදුම්කරුවන්ගේ කුසලතා මට්ටම් ඇගයීම සඳහා TVEC ආයතනයේ දැනට පවතින

RPL සඳහා අයදුම් කිරීමේ පද්ධතිය ඩිජිටල්කරණය කර ඇත. මේ වන විට ආයතන ගණනාවකට eRPL පද්ධති ක්‍රියාත්මක කිරීමේ බලතල ලබා දී ඇති අතර දැන් එය ඉලෙක්ට්‍රොනික RPL පද්ධතිය (eRPL පද්ධතිය) ලෙස හැඳින්වේ.

ආරම්භයේ සිටම, විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් විශාල සංඛ්‍යාවක් පිළිගත් සුදුසුකම් නොමැතිව විවිධ රටවලට සංක්‍රමණය වූ අතර සත්කාරක රටවල ඔවුන් තම රැකියා කාලය තුළ තම කුසලතා, දැනුම සහ තාක්ෂණික ඥාණය ලබා ගනී. ඔවුන් තම විදේශ ප්‍රේෂණවලින් රටේ දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ආපසු පැමිණෙන සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුදුසුකම් තහවුරු කර නොමැති බැවින් නැවත රැකියා ලබා ගැනීමේදී, ස්වයං රැකියා ආරම්භ කිරීමට හෝ නැවත විදේශගත වීමට බැංකු ණයක් අයදුම්කිරීමේ දී පවා අපහසුතාවයට පත්වීමට සිදු වේ.

මෙම සන්දර්භය තුළ, අයදුම්කිරීමේ සිට RPL සහතිකය ලබාගැනීම දක්වා ඇති ක්‍රියා පටිපාටි සහ පවතින පහසුකම් පිළිබඳව ඉලක්ක කණ්ඩායම දැනුවත් කිරීම සදහා e-RPL මාර්ගෝපදේශයක් සකස් කර ඇත.



# 2.0 RPL අයදුම්කිරීම සඳහා වන නිර්ණායක

## 2.1 අවම වයස

NVQ 03 මට්ටම සහ 04 මට්ටම සඳහා අවශ්‍ය අවම වයස පහත පරිදි වේ;

- NVQ මට්ටම 02 සහ 03 - අවුරුදු 18
- NVQ මට්ටම 04 - අවුරුදු 21

## 2.2 අපේක්ෂකයින්ගේ සුදුසුකම්

රැකියාවක දැනට නිරතව සිටිය යුතු හෝ වසරකට පෙර ඒ හා අදාල රැකියාවක නිරත වූ (නමුත් දැනට එසේ නොවන) අයදුම්කරුවන්ට RPL හරහා NVQ සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත.

## 2.3 කර්මාන්ත/වැඩ පළපුරුද්ද

NVQ 03 සහ 04 මට්ටම සඳහා අවශ්‍ය සේවා පළපුරුද්ද පහත පරිදි වේ.

### NVQ 02 සහ 03 මට්ටම

1. තමන්ගේම ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නන් - වසර 1 1/2 ක සේවා පළපුරුද්ද තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරීගෙන් සේවා සහතිකය

2. විධිමත් අංශයේ සේවයේ නියුතුවන්නන් - වසර 1 1/2ක සේවා පළපුරුද්ද සඳහා සේවායෝජකයාගෙන් සේවා සහතිකය

3. ව්‍යාපාර ලියාපදිංචිය (BR) සහිත ස්වයං රැකියාලාභීන් - වසර 1 1/2 ක සේවා පළපුරුද්ද සහිත BR සහතිකය. (BR සහතිකය වසර 1 1/2 ට වඩා පැරණි විය යුතුය)

**NVQ 04 මට්ටම**

1. NVQ මට්ටම 02/ 03 - 02 මට්ටමේ සහතිකය ලබා වසර 02ක සේවා පළපුරුද්ද ඇති පුද්ගලයින් (දැනුම තක්සේරුව (KA) අවශ්‍යනම් ඉන් සමත් විය යුතුය)

2. සෘජුව ඉල්ලුම්කරන්නන් - සේවායෝජකයා හෝ ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද වසර 04ක සේවා පළපුරුද්ද (දැනුම තක්සේරුව (KA) අවශ්‍යනම් ඉන් සමත් විය යුතුය)

TVEC ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථානයක පුහුණුව හදාරා හෝ NAITA ආධුනිකත්ව පුහුණුව (Apprenticeship Training) සම්පූර්ණ කර NVQ නොවන සහතික ඇති පුද්ගලයින්ට පහත දක්වා ඇති පරිදි පුහුණුවේ කාලසීමාව අනුව සේවා පළපුරුද්ද අඩුවෙන් සැලකිල්ලට ගනී.

| පුහුණු කාලසීමාව | NVQ මට්ටම 02 සහ 03 සඳහා අවශ්‍ය කාලසීමාව | NVQ මට්ටම 04 සඳහා අවශ්‍ය කාලසීමාව |
|---|---|---|
| මාස 6 - 12 | මාස 12 | වසර 03 |
| මාස 12 - 24 | මාස 09 | වසර 02 |
| මාස 24 - 36 | මාස 06 | වසර 1 1/2 |

## 2.3 සංක්‍රමණික සේවකයින් සඳහා සුදුසුකම්

සංක්‍රමණික සේවකයින් ඔවුන්ගේ සේවා පළපුරුද්දට අදාළ පහත සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර අදාළ වෘත්තීන් සඳහා දැනුම ඇගයීමේ පරීක්ෂණය සමත් විය යුතුය. විදේශ ගමන් බලපත්‍රය සහ සහතික කළ පිටපත්

- වීසා පිටු හෝ වැඩ බලපත්‍ර පිටපත්
- විදේශ සේවා යෝජකයින් විසින් සහතික කරන ලද සේවා පළපුරුද්ද



# 3.0 සාක්ෂි කළඹ (Evidence Portfolio) සැකසීම

NVQ සුදුසුකම් රාමුවට අනුව දී ඇති මාර්ගෝපදේශ මත සාක්ෂි පදනම් කරගෙන ඇගයීම් කටයුතු සිදු කෙරේ. සාමාන්‍යයෙන්, පුහුණුවන්නන්ගේ නිපුණතා ඇගයීම සඳහා NVQ ඇගයුම්රුවන් විසින් සාක්ෂි 16ක් භාවිතා කරයි.

එබැවින්, අයදුම්කරුවන් සේවා පළපුරුද්ද තහවුරුකිරීම සඳහා සුදුසු ලේඛනගත සාක්ෂි ඇතුළත් කිරීමෙන් “සාක්ෂි කළඹ” (Evidence Portfolio) සංවර්ධනය කිරීමට අවශ්‍ය වන අතර අවසානයේ දී එය අයදුම්කරුගේ නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා NVQ ඇගයුම්රුවන් විසින් භාවිතා කරනු ලැබේ. ඔබට පහත ආකාරයෙන් ඔබගේ සාක්ෂි කළඹ නිර්මාණය කළ හැක.

**1. යෝග්‍යතා විස්තරය - Curriculum Vitae (CV)**

(කරුණාකර ජීව දත්ත තොරතුරු, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සහ අනෙකුත් සුදුසුකම් ඇතුළුව ඔබේ යෝග්‍යතා විස්තරය සාදන්න)

**2. අධ්‍යාපන/වෘත්තීය සහතික (කරුණාකර මුල් සහතිකයේ පිටපත් අමුණන්න)**

2.1 අධ්‍යාපන සහතික

2.2 වෘත්තීය සහතික

**3. සේවා පළපුරුද්ද (කරුණාකර මුල් සහතිකයේ පිටපත් අමුණන්න)**
අයදුම්කරු රාජ්‍ය/පෞද්ගලික අංශයේ හෝ ස්වයං/විදේශීය රැකියාවක නියුතු නම්:

3.1 පත්වීම් ලිපි
3.2 සේවා ලිපි
3.3 ප්‍රවර්ධන ලිපි

විදේශ රැකියා කරන්නන් සඳහා පමණි:

3.4 විදේශ ගමන් බලපත්‍රයේ තොරතුරු පිටුවේ පිටපතක් සහ රැකියා වීසා බලපත්‍රය
3.5 අදාළ අධිකාරිය විසින් සහතික කරන ලද විදේශ රටක සේවා සහතික

අයදුම්කරු ස්වයං සේවකයෙකු නම්:

3.1 ව්‍යාපාර ලියාපදිංචිය (BR)
3.2 ව්‍යවසායක අත්දැකීම් පිළිබඳ සාක්ෂියක් ලෙස ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳ වාර්තා

**4. සම්මාන / පිළිගැනීම් (කරුණාකර මුල් සහතිකයේ පිටපත් අමුණන්න)**

4.1 සේවා ඇගයීම් ලිපි
4.2 සේවා සම්මාන

**5. ස්වේච්ඡා සේවය (සහතික/සේවය අගය ලබාදුන් ලිපිවල පිටපත් අමුණන්න)**

**6. ඔබ ඉල්ලුම් කර ඇති රැකියාවේ එක් එක් ඒකකයට අදාළව සිදු කරන ලද වැඩ/ ව්‍යාපෘති/ පැවරුම් පිළිබඳ වාර්තා** (අදාළ ජාතික නිපුණතා සම්මත TVEC වෙබ් අඩවිය www.tvec.gov.lk වෙතින් ලබාගත හැක).

උදාහරණයක් ලෙස, අපි උපස්ථායක NVQ 04 මට්ටම සැලකිල්ලට

| No. | Units | Code No. | Compulsory/Optional |
|---|---|---|---|
| 1. | Maintain the relationship with the client | N85S010U01 | Compulsory |
| 2. | Attend domestic affairs of the client | N85S010U02 | Compulsory |
| 3. | Prepare living area of the client | N85S010U03 | Compulsory |
| 4. | Maintain personal hygiene and appearance of the client | N85S010U04 | Compulsory |
| 5. | Maintain nutrition of the client | N85S010U05 | Compulsory |
| 6. | Provide drug treatment | N85S010U06 | Compulsory |
| 7. | Check and record vital signs | N85S010U07 | Compulsory |
| 8. | Care of an elderly person | N85S010U08 | Compulsory |
| 9. | Care of postnatal mother & new born | N85S010U09 | Compulsory |
| 10. | Care of an infant/ toddler | N85S010U10 | Compulsory |
| 11. | Care of the child | N85S010U11 | Compulsory |
| 12. | Care of a client with special needs | N85S010U12 | Compulsory |

**Qualification for National Vocational Qualifications (NVQ)**

| Qualification Package | Description | Package Level | Units for Package |
|---|---|---|---|
| N85S010Q1L3 | Care Giver | L3 | U01 + U02 + U03 + U04 + U05 |
| N85S010Q2L4 | Care Giver (Elderly Care) | L4 | U01 + U02 + U03 + U04 + U05 + U06 + U07 + U08 |
| N85S010Q3L4 | Care Giver (Maternal and child care) | L4 | U01 + U02 + U03 + U04 + U05 + U06 + U07 + U09 + U10 + U11 |
| N85S010Q4L4 | Care Giver (Client with special needs) | L4 | U01 + U02 + U03 + U04 + U05 + U06 + U07 + U12 |
| N85S010Q5L4 | Care Giver | L4 | U01 + U02 + U03 + U04 + U05 + U06 + U07 + U08 + U09 + U10 + U11 + U12 |



## 4.0 eRPL ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතන

| ආයතනය | eRPL අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වෘත්තීන් | දුරකථන අංක | ඊමේල් ලිපිනය |
|---|---|---|---|
| **ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA)** | සියලුම වෘත්තීන් | 011 288 8782 | info@naita.gov.lk |
| **ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)** | සියලුම වෘත්තීන් | 011 727 0270 | cgjp@vtasl.gov.lk |
| **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET)** | සියලුම වෘත්තීන් | 011 242 1580 | info@dtet.gov.lk |

| ආයතනය | eRPL අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වෘත්තීන් | දුරකථන අංක | ඊමේල් ලිපිනය |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM)** | හෝටල් සහ සංචාරක අංශයේ වෘත්තීන් | 011 238 2213 | info@ slithm.edu. lk |
| **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (OCUSL)** | ධීවර හා ජලජ ආශ්‍රිත වෘත්තීන් | 0114 346 979 | admin@ ocu.ac.lk |
| **ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (NIPM)** | වැවිලි කර්මාන්ත අංශයේ වෘත්තීන් | 011 277 0232 | info@nipm. gov.lk |
| **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB)** | ජලනල ආශ්‍රිත වෘත්තීන් | 011 222 4888 | nwsdbch@ sltnet.lk |

- ක්‍රියාත්මක කරන ආයතන විස්තර සහ ලිපිනයන් TVEC වෙබ් අඩවියෙන් ලබා ගත හැක.



# 5.0 පරතරය පිරවීමේ (Gap filling) මොඩියුල / පාඨමාලා

eRPL අයදුම්කරුවන්ගෙන් ලැබෙන ඉල්ලීම මත පදනම්ව, අදාල ආයතනය විසින් gap filling හෝ bridging වැඩසටහන් සංවිධානය කළ යුතු අතර ඔවුන් මේ සම්බන්ධයෙන් සාධාරණ ගාස්තුවක් අය කරනු ඇත.




# 6. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුකම

මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුකම ස්ථාපිත කර ඇති අතර දේශීය හා විදේශීය අයදුම්කරුවන්ට eRPL ක්‍රියාත්මක කරන ආයතන වල වෙබ් අඩවිවලට පිවිසීමෙන් ඉදිරිපත් කළ හැකි අතර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසු eRPL ක්‍රියාත්මක කරන ආයතනය අයදුම්කරු සම්බන්ධ කර ගනු ඇත.

TVEC


තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
නිපුණතා පියස, නො. 354/2,
ඇල්විටිගල මාවත, කොළඹ 05.

දු.ක. : 011-760 8000
විද්‍යුත් තැපෑල : info@tvec.gov.lk
වෙබ් : www.tvec.gov.lk



අනුග්‍රහය : International Labour Organization | ජාත්‍යන්තර කම්කරු සංවිධානය